සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

සංස්කරණ ප්‍රතිපත්තිය හා උපදේශ පත්‍රිකාව

සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මණ්ඩලයකට යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

උපදෙස් පත්‍රිකාව

(1) සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය විමර්ශිත සඟරාවක් (Refereed Journal) වන අතර ඒ සඳහා ඕනෑ ම විෂයකින් සිංහල භාෂාවෙන් ලියැවුණු ලිපි පමණක් භාර ගැනේ.

(2) ඉදිරිපත් කරනු ලබන ලිපියේ වචන සංඛ්‍යාව 4000-6000ත් අතර විය යුතු ය.

(3) සාරසංක්ෂේපය (Abstract) වචන 300කට නොවැඩි ව ප්‍රමුඛ පද 5ක් අකාරාදි පිළිවෙළින් ඇතුළත් කොට එහි ඉංග්‍රීසි පරිවර්තනයත් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(4) මෙම ශ්‍රාස්ත්‍රීය සංග්‍රහයෙහි පළ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ලිපි පහත පරිදි ව්‍යූහගත කළ යුතු ය:

- පර්යේෂණ මාතෘකාව
- කර්තෘ නාමය සහ විද්‍යුත් ලිපිනය
- ප්‍රමුඛ පද (Key Words) පහක් සහිත ව සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා දෙකෙන් සකස් කරන ලද සාරසංක්ෂේපය (Abstract)
- හැඳින්වීම
- සාහිත්‍ය විමර්ශනය
- පර්යේෂණ ගැටලුව
- පර්යේෂණ අරමුණු
- පර්යේෂණයේ වැදගත්කම
- පර්යේෂණ ක්‍රමවේදය

- දත්ත විශ්ලේෂණය
- නිගමනය
- පරිශීලිත මූලාශ්‍රය

(5) ලිපි පරිගණක යතුරු ලියනය කළ යුතු ය. සිංහල අකුරු සඳහා Iskoola Pota (Unicode) (අක්ෂර ප්‍රමාණ: ප්‍රධාන මාතෘකාව 16, අනුමාතෘකා 14, පෙළ 12) යන අක්ෂර ප්‍රමිතීන් ද ඉංග්‍රීසි භාෂාව සඳහා Times New Roman (Font size: Title 15, Sub title 13, Text 11) යන අක්ෂර ප්‍රමිතීන් ද භාවිත කළ යුතු ය. ප්‍රධාන පෙළ සඳහා A4 ප්‍රමාණයේ පිටුවල පේළි පරතරය 1.5 තිබිය යුතු ය.

(6) මාතෘකා හා අනුමාතෘකා කෙටි හා පැහැදිලි විය යුතු අතර ඒවා තද කළු අකුරෙන් විය යුතු ය.

(7) උපුටා ගැනීම් වචන විස්සට වඩා වැඩි නම් ප්‍රධාන පෙළෙන් වෙන ම දකුණින් ඇතුළට පන්නා උද්ධෘත ලක්ෂණ රහිත ව තබන්න. වචන විස්සට වඩා අඩු උපුටාගැනීම් පෙළ තුළ ම උද්ධෘත ලක්ෂණ සහිත ව තබන්න.

(8) සිංහල නොවන පද තද කළු අකුරෙන් තිබිය යුතුය. සිංහල අකුරෙන් දැක්වෙන ග්‍රන්ථ නාම තද කළු අකුරින් ද ඉංග්‍රීසි අකුරෙන් දැක්වෙන ග්‍රන්ථ නාම ඇල අකුරෙන් ද දැක්විය යුතු ය.

(9) ලේඛනයේ දී එකේ සිට දහය දක්වා වන සංඛ්‍යා සඳහා අකුරු භාවිත කළ යුතු වන අතර 11 සිට ඉහළට ඇති සංඛ්‍යා සඳහා අංක භාවිත කළ යුතු ය.

(10) වගුවල මාතෘකා අදාළ වගුවට ඉහළින් දැක්විය යුතු ය. ඒ සඳහා වන මූලාශ්‍රය හෝ සටහන් වගුවට පහතින් සඳහන් කළ යුතු ය.

(11) රූප සටහන්වල මාතෘකා අදාළ රූප සටහනට පහළින් දැක්විය යුතු ය. ඒ සඳහා වන මූලාශ්‍රය ද ඒ සමග ම යෙදිය යුතු වේ.

(12) වගු හෝ රූප සටහන් වෙන වෙන ම පිළිවෙළින් අංකනය කළ යුතු ය. තීරු මාතෘකා මගින් ඉදිරිපත් කළ දත්ත මනාව දැක්විය යුතු ය.

(13) Ms Word වපසරියකින් ප්‍රතිනිර්මාණය කළ නොහැකි රූප වෙන ම A4 කොළයක ඉදිරිපත් කළ යුතු වන අතර ඒවාහි මාතෘකා පිළිබඳ තොරතුරු සටහන් මූලාශ්‍රය හා ලේඛනයෙහි ඒවාට හිමි නියම ස්ථානය ද පිළිබඳ විස්තර ද ඒ සමග විය යුතු ය.

(14) මූලාශ්‍රය සටහන් ඉදිරිපත් කිරීම සඳහා APA 7 ක්‍රමය භාවිත කළ යුතු ය.

විමර්ශන සටහන් හෝ මූලාශ්‍රය සටහන් යෙදීම

1. පොත්

- එක් කර්තෘවරයකු සහිත පොත්
    - පෙළෙහි දැක්වීම: (පෙරේරා, 2025) හෝ පෙරේරා (2025) පෙන්වා දෙන පරිදි...
    - ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: පෙරේරා, එස්. (2020). **ශාස්ත්‍රීය ලේඛන කලාව.** ඇස්. ගොඩගේ.
- කර්තෘවරුන් දෙදෙනෙකු සහිත පොත්
    - පෙළෙහි දැක්වීම: (සිල්වා හා ජයසූරිය, 2019) හෝ සිල්වා හා ජයසූරිය (2019) අදහස් කරන්නේ...
    - ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: සිල්වා, එන්., ජයසූරිය, කේ. (2019). **සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රම.** කර්තෘ ප්‍රකාශනය.
- කර්තෘවරුන් තිදෙනෙකු හෝ වැඩි ගණනක් සහිත පොත
    - පෙළෙහි දැක්වීම: (රත්නායක සහ තවත් අය, 2021) හෝ රත්නායක සහ තවත් අය (2021) විස්තර කරන්නේ...
    - ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: රත්නායක, එම්., ප්‍රනාන්දු, ඩී., කුමාර, ටී. (2021). **අධ්‍යාපනයේ ගුණාත්මක පර්යේෂණ.** විද්‍යා ප්‍රකාශන.
- සංස්කරණය කරන ලද පොතක පරිච්ඡේදයක් (Chapter in an Edited Book)
    - පෙළෙහි දැක්වීම: (විජේසිංහ, 2018)
    - ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: විජේසිංහ, ආර්. (2018). ග්‍රාමීය අධ්‍යාපනයේ අභියෝග. එස්. පෙරේරා (සංස්.), **ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රවණතා** (පි. 45–62). ඇස්. ගොඩගේ.

2. සඟරා ලිපි

- පෙළෙහි දැක්වීම: (සිල්වා, 2022)
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: සිල්වා, එන්. (2022). කොවිඩ්-19 අර්බුදයේදී දුරස්ථ අධ්‍යාපනය. **ශ්‍රී ලංකා අධ්‍යාපන සඟරාව**, 15(2), 25–40. https://doi.org/10.xxxx/xxxxx

3. වෙබ් අඩවි

- ආයතනික වෙබ් අඩවි
    - පෙළෙහි දැක්වීම: (සෞඛ්‍ය අමාත්‍යාංශය, 2023)
    - ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: සෞඛ්‍ය අමාත්‍යාංශය. (2023, මැයි 10). **දුම්පානය අඩු කිරීමේ ජාතික වැඩසටහන**. https://www.health.gov.lk/

- දිනය නොදන්නා විට (n.d.)
    - පෙළෙහි දැක්වීම: (ශ්‍රී ලංකා මහ බැංකුව, n.d.)

- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: ශ්‍රී ලංකා මහ බැංකුව. (n.d.). **වාර්ෂික වාර්තාව**. https://www.cbsl.gov.lk/

4. පුවත්පත් ලිපි

- පෙළෙහි දැක්වීම: (ප්‍රනාන්දු, 2024)
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: ප්‍රනාන්දු, ජේ. (2024, ජනවාරි 15). විශ්වවිද්‍යාල පර්යේෂණ සඳහා අරමුදල්. **දිනමිණ**, පි. 5.

5. නිබන්ධන / ආචාර්ය උපාධි ප්‍රබන්ධ

- පෙළෙහි දැක්වීම: (ජයසිංහ, 2020)
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: ජයසිංහ, ඩී. (2020). **ග්‍රාමීය පාසල්වල ගුරු ප්‍රතිපත්ති** [ආචාර්ය උපාධි ප්‍රබන්ධය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය]. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය.

6. සම්මන්ත්‍රණ පත්‍රිකා

- පෙළෙහි දැක්වීම: (සිල්වා, 2023)
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය: සිල්වා, එම්. (2023, නොවැම්බර් 20–21). ***සිංහල භාෂාවේ අනාගතය*** [සම්මන්ත්‍රණ පත්‍රිකාව]. ජාතික භාෂා සම්මන්ත්‍රණය, කොළඹ, ශ්‍රී ලංකාව.

අවධානයට

- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය කර්තෘගේ වාසගම අනුව අකාරාදි පිළිවෙළට සකසන්න.
- පෙළෙහි දැක්වීමේ දී කර්තෘගේ වාසගම පමණක් යොදන්න; එක ම වාසගමැති කර්තෘවරුන් කිහිප දෙනෙකු ඇත්නම් මුලකුරු ද යොදන්න.
- සිංහල අකුරෙන් දැක්වෙන පොත් හා සඟරා නම් තද කළු අකුරින් ද ඉංග්‍රීසි අකුරින් දැක්වෙන පොත් හා සඟරා නම් ඇල අකුරින් (italics) ද දක්වන්න.
- DOI ඇත්නම් https://doi.org/... ලෙස දෙන්න.

ප්‍රධාන සංස්කාරක
සබරගමුව විශ්ව විද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ ඒකකය
ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය
බෙලිහුල්ඔය
දුරකථනය: 045-2280013/071-8569951